din-10-24-uns-064184-54X4-akw WC 568

# ලංසු සඳහා ආරාධනයයි

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

## ආරක්ෂක අමාත්‍යාංශය

## කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

**විශ්වවිද්‍යාල රෝහල සඳහා හයිපර්බරික් ඔක්සිජන් ප්‍රතිකාර ඒකකය (Hyperbaric Oxygen Therapy (HBOT) Unit) සැපයීම, ස්ථාපනය සහ ක්‍රියාත්මක කොට පෙන්වීම**

**කොන්ත්‍රාත් අනන්‍යතා අංකය : MOD/KDU/03/2021**

01. ශ්‍රී ලංකාව, රත්මලාන, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙනුවෙන් ආරක්ෂක අමාත්‍යාංශයේ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් ප්‍රසම්පාදනය සඳහා මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

    **ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ විශ්වවිද්‍යාල රෝහල සඳහා හයිපර්බරික් ඔක්සිජන් ප්‍රතිකාර ඒකක (Hyperbaric Oxygen Therapy (HBOT) Unit) එකක් (01) සැපයීම, ගෙනැවිත් භාරදීම, ස්ථාපනය, ක්‍රියාත්මක කර පෙන්වීම, පුහුණුව හා නඩත්තුව.**

02. ලංසුකරණ ක්‍රියාදමය ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය මගින් මෙහෙයවනු ලැබේ.

03. HBOT සැපයීම හා නඩත්තුව පිළිබඳ අඩුතරමින් වසර 10 ක පළපුරුද්ද සහිත හා අඩුතරමින් වසර 10 ක කාලයක ව්‍යාපාර ලියාපදිංචියක් සහිත නිෂ්පාදකයින්ගෙන් ලංසු කැඳවනු ලැබේ. විදේශීය ලංසුකරුවන්ට යථාපරිදි පත්කළ (බලයපැවරූ) ශ්‍රී ලංකා නියෝජිතයින් මගින් මිල ගණන් ඉදිරිපත් කළ හැකිය.

    ඉහත කී දේශීය නියෝජිතට අඩුතරමින් වසර 05 ක ව්‍යාපාර ලියාපදිංචියක් සතු විය යුතුය.

    සියලුම සන්නාමයන්ට/ නිෂ්පාදනයන්ට ශ්‍රී ලංකාව තුළ හෝ උත්පාදක මුල් රට තුළ අවම වශයෙන් වසර 05 ක සේවා ඉතිහාසයක් තිබිය යුතුය.

    නිෂ්පාදක වෙතින් අමතර කොටස්. මෘදුකාංග සහ උපාංග ලබාගත හැකි බවට ලංසුකරු විසින් වසර 10 ක වගකීමක් ලබා දිය යුතුය.

    ස්ථාපනය කළ පද්ධතිය පිළිබඳව වගකීම් කාලය තුළ යම් විමසීමක් කිරීම සඳහා දේශීය කාර්යාලයක් තිබීම හෝ දේශීය ලියාපදිංචි නියෝජිතයකු සිටීම හෝ සුදුසුය.

04. කොන්ත්‍රාත්තුව නිමා කිරීමේ කාලය, කොන්ත්‍රාත්තුව අත්සන් කළ දින සිට කැලැන්ඩර් දින 90 කි.

05. අභිලාෂී ලංසුකරුවන්ට ශ්‍රී ලංකාව, බොරලැස්ගමුව, වේරහැර, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ. ප්‍රසම්පාදන නිලධාරී වෙතින් වැඩිමනත් තොරතුරු ලබාගත හැකිය. ඊමේල් : procurement_uh@kdu.ac.lk
    (දුරකථනය : 011-2044555/ දිගුව 4373 ෆැක්ස් : 0112-044592)

    ලංසුකරණ ලිපිලේඛන 2021-10-25 දින සිට 2021-11-15 දින තෙල් කාර්යාල දිනයන්හි 0900 පැය සිට 1500 පැය දක්වා පහත සඳහන් ලිපිනයේදී නොමිලේ පරීක්ෂා කර බැලිය හැකිය.

    **ප්‍රසම්පාදන ශාඛාව, ආරක්ෂක අමාත්‍යාංශය,**
    **ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුරය, කෝට්ටේ.**
    **දුරකථනය : 011-2390719 ෆැක්ස් : 011-2390720 සහ** procurement@defence.lk

06. ලංසුකරු හෝ ඔවුන්ගේ දේශීය නියෝජිත අසාධු ලේඛන ගත නොවූ අය විය යුතුය.

07. පහත සඳහන් ලිපිනයට ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ශ්‍රී ලංකා රුපියල් තිස්හයදහසක (ශ්‍රීලංරු. 36,000.00) ආපසු නොගෙවන ගාස්තුවක් ආරක්ෂක අමාත්‍යාංශය වෙත මුදලින් ගෙවීමෙන් අනතුරුව ඉංග්‍රීසි බසින් වන ලංසුකරණ ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය. ලංසුකරණ ලිපිලේඛන 2021-10-25 දින සිට 2021-11-15 දින දක්වා නිකුත් කරනු ලැබේ.

    **ප්‍රධාන මූල්‍ය නිලධාරී I,**
    **දෙවන මහල,**
    **ආරක්ෂක අමාත්‍යාංශය,**
    **ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.**

    (අදාළ වන විට) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත යටතේ ලියාපදිංචි සහතිකය ලංසු හා සමග ඉදිරිපත් කරන ලෙස ලංසුකරුවන් හට දැඩිව අවවාද කරනු ලැබේ.

08. ලංසු, 2021-11-16 දින 1400 පැයට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ගෙනැවිත් භාරදිය යුතුය. නැතහොත් පහත ලිපිනයේ තබා ඇති ලංසු පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

    **ප්‍රධාන මූල්‍ය නිලධාරී (I) කාර්යාලය,**
    **දෙවන මහල, ආරක්ෂක අමාත්‍යාංශය,**
    **ආරක්ෂක අමාත්‍යාංශ මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.**

    ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කෙරේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම, ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගී වීමට බලාපොරොත්තු වන ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරිපිටදී ලංසු විවෘත කෙරේ.

09. සියලුම ලංසු සමග, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් අනුමත ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන බැංකුවකින් ශ්‍රීලංරු. 3,750,000.00 ක (ශ්‍රී ලංකා රුපියල් තිස්හත් ලක්ෂ පනස් දහසක) වටිනාකමට ලබාගත් කොන්දේසි විරහිත හා ඒක්ෂණ ආකාරයේ. 2021-11-16 දින සිට 2022-03-15 දින දක්වා (ලංසු විවෘත කිරීමෙන් පසුව කැලැන්ඩර් දින 119 කට) වලංගු ලංසු සුරක්ෂණයක් එවිය යුතුය. ලංසු සුරක්ෂණයේ ලාභියා ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විය යුතුය.

    ලංසුව 2021-11-16 දින සිට 2022-02-17 දින දක්වා (ලංසු ඉදිරිපත් කිරීමේ අවසාන දින සිට කැලැන්ඩර් දින 91 ක්) වලංගු විය යුතුය.

10. විමසීම් විස්තර

    **ප්‍රධාන මූල්‍ය නිලධාරී I,**
    **දුරකථනය : 0094-11-2439381**
    **ෆැක්ස් : 0094-11-2390720**
    **ඊමේල් :** procurement@defence.lk

11. ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගිවන පුද්ගලයාගේ නම සහ ජාතික හැඳුනුම්පත්/ විදේශ ගමන් බලපත්‍ර අංකය ලංසු විවෘත කිරීමේ දිනයට අඩුතරමින් කාර්යාල දින 3 කට වත් කලින් ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරී - I වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

    තවද, අදාළ ප්‍රසම්පාදනය හා සම්බන්ධ ඕනෑම රාජකාරී කාරණයකදී සහභාගිවන පුද්ගලයාගේ නම හා ජාතික හැඳුනුම්පත්/ විදේශ ගමන් බලපත්‍ර අංකයද

    **ප්‍රධාන මූල්‍ය නිලධාරී - I,**
    **ආරක්ෂක අමාත්‍යාංශය**
    **වෙත ලිඛිතව දැනුම් දෙන ලෙස ලංසුකරුවන්ට දන්වා සිටිනු ලැබේ.**

12. 2021-11-02 දින 1,000 පැයට පූර්ව - ලංසු රැස්වීමක් බොරලැස්ගමුව, වේරහැර, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහලේ, වෛද්‍ය සේවා සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වේ.

**සභාපති,**
**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,**
**ආරක්ෂක අමාත්‍යාංශය,**
**ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,**
**ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.**